# සම්‍යග්ඥානය

## අන්නම්භට්ටගේ (තර්කසංග්‍රහය) නිර්වචනය

මහාචාර්ය, මකුරුප්පේ ධම්මානන්ද හිමි.

භාරතීය න්‍යාය ශාස්ත්‍රය බෞද්ධ, ජෛන සහ හින්දු යනුවෙන් තෙවැදෑරුම් වන අතර තර්කසංග්‍රහය අයත් වන්නේ එයින් හින්දු න්‍යාය ශාස්ත්‍රයට ය. න්‍යාය හා වෛශේෂික දර්ශනවාද දෙකෙහි මූලික ඉගැන්වීම් සංකලනය කොට 7 වන සියවස අගභාගයෙහි දී ආන්ද්‍ර දේශයේ විසූ අන්නම්භට්ට නම් ආචාර්යවරයෙකු විසින් තර්කසංග්‍රහය රචනා කරන ලදි. 11 වන සියවසේ ශිවදත්ත නම් පඬිවරයෙකු විසින් වෛශේෂික දර්ශනය ඇසුරෙන් ලියන ලද සප්තපදාර්ථී නම් කෘතිය මොහුගේ ප්‍රධාන ආශ්‍රය විය. ප්‍රමුඛ තාර්කිකයෙකු නොවන අන්නම්භට්ට විචාරකයෙකු ලෙසින් න්‍යාය වෛශේෂික දර්ශනවාදයන් ඒකාබද්ධ කොට සැකෙවින් හා සරල බසින්මෙම කෘතිය සංග්‍රහ කිරීම අතිශයින් ප්‍රශස්ත කර්තව්‍යයකි. මෙ ලිපියේ අරමුණ තර්කසංග්‍රහය තුළ විවරණය වන අදහස් සමාලෝචනය කිරීම වන හෙයින් ඊට ආරම්භයක් ලෙස භාරතීය ෂඩ් දර්ශනය පිළිබඳ සැකෙවින් දැක්වීම සුදුසුය.

න්‍යාය, වෛශේෂික, සාංඛ්‍ය, යෝග, පූර්ව මීමාංසා හා උත්තර මීමාංසා යන දර්ශන සම්ප්‍රදායයන් භාරතීය ෂට් දර්ශනය නමින් හැඳින්වේ. මේවා යුගල පද ලෙස බහුල ව්‍යවහාරයට පැමිණ ඇත. ඒ අනුව න්‍යාය හා වෛශේෂික සම්ප්‍රදායන් ද සාංඛ්‍ය හා යෝග සම්ප්‍රදායන් ද ඒකාබද්ධ වේ. මෙසේ සිදුවී ඇත්තේ එක් සම්ප්‍රදායකින් ඉදිරිපත් කරනු ලබන අදහස්වලට අනෙක් සම්ප්‍රදාය විසින් ඌනපූරණය කරනු ලබන හෙයිනි. නිදසුනක් ලෙස න්‍යාය සම්ප්‍රදාය මගින් ඥානවිභාගය අවධාරණය කරන කල්හි වෛශේෂික සම්ප්‍රදාය විසින් ඊට අදාළව අධිභෞතිකවාදය ඉදිරිපත් කරනු ලබයි. මේවායේ පවත්නා සම්බන්ධතාව නිසා න්‍යාය සම්ප්‍රදායයෙන් අධිභෞතිකවාදයත් වෛශේෂික සම්ප්‍රදායෙන් ඥානවිභාගවාදයත් පිළිගැනුණි. මෙසේ ම සාංඛ්‍ය හා යෝග දර්ශන ද එකිනෙකට සම්බන්ධය. සාංඛ්‍ය දර්ශනය විශ්වය පිළිබඳ පරිණාමවාදයක් ඉදිරිපත් කරන අතර යෝග දර්ශනය දක්වනුයේ මූලික වශයෙන් සංසාර විමුක්තිය පිස යෝග භාවනාවය. මෙම දර්ශන දෙක එකිනෙකෙහි පිළිගැනීම් අනුමත කිරීම විශේෂත්වයයි. එබැවින් න්‍යාය හා වෛශේෂික දර්ශන සිද්ධාන්තමය පිළිගැනීම්වලින් වෙනස් වන්නේ සාංඛ්‍ය හා යෝග මතවාදවලට ය. මෙය තවදුරටත් පැහැදිලි කරන්නේ නම් වෛශේෂික සම්ප්‍රදාය ලෝකය විග්‍රහ කරන්නේ එය ස්ථිතියක් ලෙසිනි. එහි ක්‍රියාවක් ලෙස පිළිගන්නේ චලනයක් බවයි. 'කුරුල්ලා පියාඹයි' යන මෙහි පියාඹීම යනු පියාපත්වල චලනයකි. එහෙත් සාංඛ්‍යයන්ගේ මතය අනුව ලෝකය විග්‍රහ වන්නේ පරිණාමයක් ලෙසිනි. මේ නිසා පැහැදිලිවම වෛශේෂික හා සාංඛ්‍ය දර්ශනවල පරස්පර විරෝධීතාවක් ඇත. මීමාංසා දර්ශන වෛදික දර්ශනය පදනම් කොට ගත් ඒවා වන අතර හින්දු න්‍යාය ශාස්ත්‍රයට සම්බන්ධයක් නොමැත. මෙම දර්ශනවාද අතරින් තර්කසංග්‍රහය සම්පාදනය වී ඇත්තේ න්‍යාය හා වෛශේෂික සිද්ධාන්ත සංකලනයෙනි. තවත් විධියෙකින් කිවහොත් තර්කසංග්‍රහයෙහි විවරණය වන්නේ කණාද ගෞතමයන්ගේ මතවාදයන් ය. 'කණාද' යන්නෙහි තේරුම කැබිලිකන්නා යන්නයි. 'කණ' යනු කැබලි නොහොත් පරමාණුය. 'අද' යනු කන්නාය. භාරතීය පරමාණුවාදය පිළිගත් හෙයින් මොහුට 'ක්‍ෂණභක්‍ෂ' යනු ද නමක් වේ. මොහු විසින් ඉදිරිපත් කරනුයේ පදාර්ථ වශයෙන් විවරණයක් විනා අපට හුරු පුරුදු ලොජික් යන වචනයෙන් අර්ථවත් වන විධියේ තර්ක ක්‍රමයක් නොවේ. මෙය තර්කසංග්‍රහය නමින් නොව පදාර්ථසංග්‍රහය නමිනුදු හැඳින්වීම සුදුසු බව ඇතැම් වියතුන්ගේ අදහසය.[1] තර්කසංග්‍රහය හදාරන ආධුනිකයන් විසින් මෙය මූලික වශයෙන් හඳුනාගෙන තිබිය යුතුය. බටහිර තර්ක ශාස්ත්‍රය ලොජික් යන නමින් ව්‍යවහාර වන අතර එය භාෂාව හැසිරවීමේ පදනම මත අර්ථවත් වන්නකි. එයට අනුමාන ශාස්ත්‍රය යන්න වඩාත් යෝග්‍ය වේ. සොක්‍රටීස් සහ ප්ලේටෝ යන දෙදෙනා විසින් 'න්‍යාය' පිළිබඳව දරණ ලද අදහස් පදනම් කොට ගෙන ඇරිස්ටෝටල්ගේ න්‍යාය ශාස්ත්‍රය බිහිවී ඇත. පෙරදිග දර්ශනයත් බටහිර දර්ශනයත් අතර පැහැදිලි වෙනසක් ඇත. බටහිර තර්ක ශාස්ත්‍රය ශුද්ධ තර්ක ක්‍රමයක් ලෙස පිළිගැනේ. තර්ක ගොඩනැගීමේ එම තර්කවල සප්‍රමාණ නිෂ්ප්‍රමාණ බව සලකා බැලීම සිදු කෙරෙන බැවිනි. පෙරදිග තර්ක ක්‍රමය ශුද්ධ තර්ක ක්‍රමයක් ලෙස නොසැලකෙනුයේ එයින් ඥානවිභාගාත්මක හා මනෝවිද්‍යාත්මක කරුණු සාකච්ඡා කෙරෙන හෙයිනි. බටහිර තර්කය හුදෙක් දර්ශනවාදය ඇසුරින් බිහිවී ඇත. පෙරදිග තර්කය හුදෙක් ආගම් ඇසුරෙන් ප්‍රභවය වී ඇත.

# තර්කසංග්‍රහයේ විෂය ක්ෂෙත්‍රය

තර්කසංග්‍රහයේ අරමුණ වන්නේ තර්කයන්ගේ සංග්‍රහ කිරීමයි. මෙහි තර්ක යන්නෙන් අදහස් වන්නේ පදාර්ථය. පදාර්ථ යනු භාෂාවේ යෙදන පදවල අර්ථ හෙවත් අරමුණුය. කණාද ආචාර්යවරයා දක්වන පරිදි පදාර්ථ හතක් දක්නා ලැබේ. ඒවා සප්ත පදාර්ථ නමින් හැඳින්වේ. ද්‍රව්‍ය, ගුණ, කර්ම, සාමාන්‍ය, විශේෂ, සමවාය, අභාව යනු ඒ හතයි.[2] කිසියම් පදනමක් මත පිහිටා මෙම පදාර්ථ මගින් විශ්වය විශ්ලේෂණය කිරීමක් තර්කසංග්‍රහයෙන් සිදු කෙරේ.

ඉහත දක්වන ලද පදාර්ථ වෙන වෙනම හඳුනාගැනීම තර්කසංග්‍රය හැදෑරීමේදී ආධුනිකයන් විසින් අනිවාර්යයෙන්ම කළ යුත්තක් බව තේරුම් ගත යුතුය. මෙම පදාර්ථ අතරින් දෙවැන්න වන ගුණ නම් වූ පදාර්ථය මෙහි වැඩි දුරටත් විශ්ලේෂණය වේ. සංඛ්‍යාත්මක වශයෙන් ගුණ විසි හතරකි. ඒවා අතරින් බුද්ධි යනු එක් ගුණයකි. තර්කසංග්‍රහයෙහි විශේෂ විමර්ෂණයට ලක්වන්නේ එකී බුද්ධි විවරණයයි. නිරවද්‍ය මිනිස් චින්තනය සම්බන්ධයෙන් යා යුතු උපාය මාර්ග විනිශ්චය මෙම බුද්ධි විග්‍රහයෙන් සිදු කෙරේ. හින්දු මතවාදීහු දාර්ශනික වශයෙන් සත්‍යාදී ලෝකය සම්බන්ධයෙන් අවිනශ්වර සත්තාවන් දෙකක් පිළිගනිති. එකක් නම් ඊශ්වර සත්තාවයි. දෙවැන්න නම් අමරණීය ආත්මයක සත්තාවයි. මෙම සත්තාව පැහැදිලි කිරීම පිණිස වෛශේෂිකයන් විසින් කරනුයේ ලොව ඇති සෑම වස්තුවක්ම පරමාණුව දක්වා විශ්ලේෂණය කළ හැකි බව සහ ඥානය හසුරුවන ඒවා කිසියම් පදාර්ථයකට අයත් බව ගෙනහැර දැක්වීම ය. බුද්ධි ගුණය ස්මෘතිය හා අනුභවය යනුවෙන් දෙකොටසකට බෙදේ. ඉන් අනතුරුව ඒ දෙකම යථාර්ථස්මෘති, අයථාර්ථස්මෘති යනුවෙන් හා යථාර්ථානුභව, අයථාර්ථානුභව යනුවෙන් බෙදා දක්වයි. මෙයින් වැදගත් වන්නේ යථාර්ථානුභවයයි. එන්ම නිරවද්‍යඥානයයි. තවත් විධියකින් කිවහොත් යථාර්ථානුභවයෙන් සිදුවන්නේ නිවැරදි අවබෝධයයි. මෙම නිවැරදි දැනුම ලබා ගැනීමේ ක්‍රම හතරක් ඇති බව න්‍යාය හා වෛශේෂික මතය බව තර්කසංග්‍රහයේ දැක්වේ. ඒවා නම්;

| | |
|---|---|
| i. ප්‍රත්‍යක්ෂය | ii. අනුමානය |
| iii. උපමානය | iv. ශබ්දය හෙවත් ආපත් වාක්‍යයි.[3] |

මෙය බෞද්ධ න්‍යාය ශාස්ත්‍රයෙන් හින්දු න්‍යාය වෙනස් වන තැනකි. බෞද්ධ පිළිගැනීම අනුව ඇත්තේ ප්‍රත්‍යක්ෂය හා අනුමානය යන ඥානාශ්‍රය දෙක පමණි.[4] තර්කසංග්‍රහයේ වැඩි අවධානයක් යොම වන සංකල්පය වන්නේ ඉහත කී ඥානාශ්‍රවලින් අනුමානයයි. එම අනුමානය පිළිබඳව තර්ක සංග්‍රහයේ එන අදහස් ආධුනිකයෙකුට හින්දු තර්ක ශාස්ත්‍රය පිළිබඳ ප්‍රමාණවත් අවබෝදයක් ලබා ගැනීමට සෑහෙන බව පෙනේ. තර්කසංග්‍රහය අනුව ප්‍රත්‍යක්ෂය යනු ඉන්ද්‍රිය හා අරමුණු එකිනෙක ගැටීමෙන් ඇති වන ඥානයයි.[5] එය නිර්විකල්ප සවිකල්ප යනාදී විසින් ප්‍රභේදගත වේ. අනුමානය නම් පෙනෙන දෙයක් අනුව නොපෙනෙන දෙයක් දැන ගන්නා ක්‍රමයයි. මේ සඳහා සංවාක්‍යයක් මගින් කරුණු දැක්වීමක් මෙහිලා සිදුවේ. උපමානය යනු යමක් උපමාවක් මිගන් දැන ගැනීමයි. කුළු මීමෙක් දැක නැති කෙනෙකුට යමෙක් කුළුමීමා යනු මීහරකා වැනි සතෙකැයි පවසයි. ඉන් පසු කැළයට යන ඔහුට මීහරකා වැනි සතෙක් දක්නට ලැබේ. ඔහු එකෙණෙහිම ඒ කුළුමීමෙකැයි දැන ගනී. ශබ්දය යනු කිසියම් විශ්වාස කටයුතු පුද්ගලයෙකුගේ හෝ දෙවි කෙනෙකුගේ නැතහොත් වේදය වැනි ආගමික ග්‍රන්ථාගත ඉගැන්වීම පිළිගැනීමයි. මෙම ක්‍රමයන්ගෙන් සම්‍යග් ඥානයක් ලබා ගත හැකි බව ඔවුහු විශ්වාස කරති.

## යථාර්ථානුභවය

බුද්ධි යන්නට සමාන වචනයක් ලෙස ඥාන, උපලබ්ධි, දැනුම යන පද දැක්විය හැකිය. බුද්ධියේ ප්‍රභේද දෙකක් ස්මෘති හා අනුභව යනුවෙන් තර්කසංග්‍රහයේ දක්වා ඇත.[6] හුදු ස්මෘතියක් නොවන දැනුම අනුභවය නම් වේ. මෙහි ස්මෘති යන්නෙන් අදහස් වන්නේ අතීතාවර්ජනයයි. 'සංස්කාරමාත්‍රජන්‍යං ඥානං ස්මෘති' පෙර තමා විසින් ප්‍රත්‍යක්ෂයෙන් දත් දේ සිහි කිරීමේ භාවනාමය කාර්යයෙන් (=සංස්කාර) ඇති වූ ඥානය ස්මෘතියයි.[6]

අනුභවය යථාර්ථ මෙන් ම අයථාර්ථ විය හැකිය. යථාර්ථය නම් නිවැරදිකමයි. කවරාකාර වූ දැනුමක් නමුත් ලැබෙනුයේ අරමුණක් ඇසුරු කොට ගෙනය. එම අරමුණට හිමි ස්වරූපය ගැනීමත් අරමුණට අහිමි ස්වරූපය නොගැනීමත් යථාර්ථානුභවයයි. ඒ මෙසේය. නිල් පැහැති උපැස් යුවළක්

පැලඳගෙන සිටින්නෙක් සුදු පැහැති චෛත්‍යයක් දෙස බලයි. එවිට ඔහුට චෛත්‍යය පෙනෙනුයේ නිල් පැහැයෙනි. මේ නිසා ඔහු චෛත්‍යය නිල් පැහැති බව සිතයි නම් ඔහු ලබන්නේ වැරදි අවබෝධයකි, අයථාර්ථානුභවයකි. එහිදී සිදුවී ඇත්තේ අරමුණට හිමි ස්වරූපය නොගැනීමක් මෙන්ම අරමුණට අහිමි ස්වරූපය ගැනීමක්ය. යථාර්ථානුභවය යනු වස්තුවක ඇති සැටිය එලෙසින් ම වටහා ගැනීමයි.[7] රිදී කැබැල්ලක් දැක මේ රිදී කැබැල්ලකැයි නිවැරදිව වටහා ගනී නම් එය යථාර්ථානුභවයයි. න්‍යායිකයන්ගේ මතය අනුව මෙම යථාර්ථානුභවය චතුර්විධ වේ.

i. ප්‍රත්‍යක්ෂය ii. අනුමානය

iii. උපමානය iv. ශාබ්ද යනුවෙනි.

මේ හතරට ප්‍රමාණ යනු තවත් නමකි. එසේම යථාර්ථානුභවය 'ප්‍රමා' යනුවෙන් ද හඳුවනු ලැබේ. මේ 'ප්‍රමා' සහ 'ප්‍රමාණ' යන වචන දෙක එකිනෙක සම්බන්ධය. ප්‍රමාණය, කරණය හෙවත් හේතුව අනුව එහි ඵලය වන ප්‍රමාව ලැබේ. ප්‍රත්‍යක්ෂ ප්‍රමාණය නිසා ප්‍රත්‍යක්ෂ ප්‍රමාව හෙවත් ප්‍රත්‍යක්ෂ බුද්ධිය ලැබේ. අනුමාන ප්‍රමාණය අනුව අනුමාන ප්‍රමාව හෙවත් අනුමාන බුද්ධිය ලැබේ. මේ අනුව පැහැදිලි වන්නේ නිවැරදි බුද්ධිය හෙවත් වැටහීම ලබා ගැනීමේ දී ප්‍රමාණය නැතහොත් හේතුව වැදගත් වන බව යි.

තවද යථාර්ථානුභවය යනු කුමක්දැයි වටහා ගැනීමේදී වැදගත් වන තවත් වචන තුනක් 'කරණ, කාරණ, කාර්යය' යනුවෙන් දක්වා ඇත. එහි 'කරණ' යන්නෙන් අදහස් වන්නේ අප සාමාන්‍ය ව්‍යවහාරයේ දී භාවිත කරන කාරණය හෙවත් හේතුව යන්නයි. එහෙත් හේතු අතරින් ප්‍රධාන හේතුව මෙහි 'කරණ' යන්නෙන් අදහස් වන බව කියයුතුය. කිසියම් දෙයක ඵලයක් ඇති වීමට ඇත්තේ එක හේතුවක් නොවේ. තර්කසංග්‍රහය දක්වන නිදසුන පරිදි කළයක් ඇති වීමට හේතු රාශියක් තිබිය යුතුය. එනම් කුඹලාගේ අත, මැටි, උත්සාහය, වතුර, කුඹල් සක යනාදී අනේකවිධ හේතු එයට අවශ්‍යය. එහෙත් කුඹලාගේ කළ හැදීමේ කාර්යයට අවශ්‍යතම හේතුව වන්නේ කුඹල් සක මත්තෙහි පිහිටා තිබෙන දණ්ඩය. (කුලාල දණ්ඩ) මෙම ආසන්නතම හේතුව හෙවත් කාරණය 'කරණය' නම් වේ.[8] 'කාරණය' යන්නෙන් අදහස් වන්නේ කාර්යයට හෙවත් ඵලය ඉපදීමට නිශ්චිත වශයෙන්ම හේතු වන්නාවූ එසේම ඵල නිෂ්පාදනයට පෙර පැවතියා වූ වස්තුවයි. 'කළය මැටිවලින් ඇතිවේ' මෙහි කළය නිෂ්පාදනය වීමට අත්‍යවශ්‍යම දේ මැටිය. එසේම එම මැටි කළය නිපදවීමට පෙර පැවති දෙයකි. එබැවින් කාර්යය නමින් හැඳින්වෙන ඵල නිෂ්පාදනයට ඒකාන්ත හේතුව වන එසේම ඊට පූර්වයෙන් පැවති වස්තුව 'කරණය' නම් වේ. කාර්යය යන්න හඳුන්වා ඇත්තේ 'කාර්‍ය්‍ය ප්‍රාගභාවප්‍රතියොගී' යනුවෙනි. ප්‍රාග් අභාවයට ප්‍රතිපක්ෂ වීම කාර්යයේ විශේෂ ලක්ෂණය බව ඉන් කියැවේ. ප්‍රාග් අභාවය නම් කිසියම් වස්තුවක් ඇති වීමට පෙර එහි නොපැවතීමයි. එම නොපැවති බව නැති කරමින් වස්තුවක ඇති වීම ප්‍රාග් අභාවයට ප්‍රතිපක්ෂවීමයි. මුලින් අවිද්‍යමාන වූ කළයක් විද්‍යමාන වීම 'කාර්යය' යන්නෙන් අදහස් වේ.

## ප්‍රත්‍යක්ෂය

තර්කසංග්‍රහයට අනුව ප්‍රත්‍යක්ෂය සම්‍යග්ඥානය හෙවත් නිවැරදි අවබෝධය ලැබීමේ මාර්ග අතුරින් පළමු වැන්නයි. මෙය ආත්මීය වූ පෞද්ගලික අත්දැකීමකි. ඉන්ද්‍රියයන් හා අරමුණු එකිනෙක සම්බන්ධ වීමෙන් ලබන දැනුම ප්‍රත්‍යක්ෂයයි.[9] මේ නිසා ඇස, කන ආදී ඉන්ද්‍රියයන් රූප, ශබ්ද ආදී අරමුණු දැකීම් ඇසීම් ආදියෙන් ඇතිවන දැනුම ප්‍රත්‍යක්ෂඥානයකි. කෙනෙකුට මෙම ප්‍රත්‍යක්ෂය දෙවිධියකට ලැබිය හැකිය. ඉන් පළමුවැන්න නම් බාහිර අරමුණු ඇස ආදී බාහිර ඉන්ද්‍රිය මගින් ග්‍රහණය කරගැනීමෙන් ලබන ප්‍රත්‍යක්ෂයයි. මෙය බාහිර ප්‍රත්‍යක්ෂය නමින් හැඳින්විය හැකිය. දෙවැන්න නම් මනසින් කරනු ලබන ආධ්‍යාත්මික ප්‍රත්‍යක්ෂයයි. මෙය මානසික ප්‍රත්‍යක්ෂය, අභ්‍යන්තර ප්‍රත්‍යක්ෂය යනාදී නම්වලින් ද හැඳින්විය හැකිය. සූත්‍ර දේශනාවල 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං...' යනාදී ලෙසින් ඇසත් රූපයත් ඇසුරු කොට චක්ෂුර් විඥානය උපදින බව දක්වා ඇත. මේ නිසා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ දී ඉන්ද්‍රිය හා අරමුණ ප්‍රධාන වශයෙන් බලපාන බව පැහැදිලිය. කෙසේ වුවත් ප්‍රත්‍යක්ෂයේ ප්‍රභේද දෙකක් පවතින බව පෙන්වා දී ඇත.

i. නිර්විකල්ප ප්‍රත්‍යක්ෂය

ii. සවිකල්ප ප්‍රත්‍යක්ෂය

නිර්විකල්ප ප්‍රත්‍යක්ෂය යනුවෙන් අදහස් කරන්නේ ඉන්ද්‍රිය හා අරමුණ එකිනෙක ගැටුණු පළමු වන ක්ෂණයෙහි ඒ පිළිබඳව ඇතිවන 'මේ කිසිවක්ය' යන ශුද්ධ සන්නිවේදන මාත්‍රයයි. මෙය නිදසුනකින් දක්වන්නේ නම් අප ජීවිතයේ කිසි දිනක නොදුටු වස්තුවක් අපට යමෙක් පෙන්නුවහොත් එය මුලින්ම දුටු අවස්ථාවෙහි අපට දැනෙනුයේ එහි නම හෝ සාදා ඇති දේ හෝ එය සීතල ද උණුසුම් ද තද ද මොලොක් ද යනාදිය නොව 'මේ කිසියම් දෙයක්ය' යන අවබෝධයයි. මෙම නාම-ජාති ආදී වග විභාග ආරෝපණය කිරීමට පෙර අවස්ථාව නිර්විකල්පක ප්‍රත්‍යක්ෂය යනුවෙන් හැඳින්වේ. තර්කසංග්‍රහයෙහි නිර්විකල්ප යන්න හඳුන්වන්නේ විශේෂ විභාග රහිත ඥානයයි.[10] සවිකල්ප ප්‍රත්‍යක්ෂය යන්නෙන් අදහස් කෙරෙන්නේ විශේෂ විභාග සහිත ඥානයයි.[11] එනම් මුල්ම ක්ෂණයෙහි අප එය සුදුය, ඝනය, උණුසුම්ය, මෙය අසවල් නම් වේ, මෙය අනුභවයට ගන්නා ආහාරයකි යනාදී වශයෙන් වග විභාග දැන ගැනීම නිර්විකල්ප ඥානයයි.

ප්‍රත්‍යක්ෂය, ලෞකික ප්‍රත්‍යක්ෂය හා අලෞකික ප්‍රත්‍යක්ෂය යනුවෙන් දෙවැදෑරුම් වේ. ඇස, කන ආදී ඉඳුරන් මගින් සිදුවන ප්‍රත්‍යක්ෂය ලෙස හැඳින්විය හැකිය. මෙය සාමාන්‍ය ලෝකයේ කවරෙකුහට වුවත් ලැබිය හැකි ඥානයකි. අලෞකික ප්‍රත්‍යක්ෂය වනාහී හුදෙක් මනින්ද්‍රිය කරණයෙන්ම සිදුවන්නකි. එසේම එය ඇතිවන්නේ කවියන්, දාර්ශනිකයන්, යෝගීන් වැනි සුවිශේෂ පුද්ගලයින්ටය. තර්කසංග්‍රහයෙහි දක්වන පරිදි ප්‍රත්‍යක්සය සිදු වන්නේ ඉන්ද්‍රිය හා අරමුණු (=අර්ථ) සන්නිකර්ෂය හෙවත් සමවාය හේතුවෙනි. එකී සන්නිකර්ෂය ඉන්ද්‍රිය සම්බන්ධය අනුව චක්ෂුසන්නිකර්ෂය යනාදී විසින් සයවැදෑරුම් වේ. තවද මෙහි තවදුරටත් ප්‍රභේද කරමින් තර්කසංග්‍රහයේ සංයෝගසන්නිකර්ෂය, සංයුක්තසමවායසන්නිකර්ෂය, සමවෙතසමවායීසන්නිකර්ෂය, සමවායසන්නිකර්ෂය, සමවෙතසමවායීසන්නිකර්ෂය, විශේෂණවිශේෂ්‍යභාවසන්නිකර්ෂය යනුවෙන් වර්ගීකොට ඇත.[11] මේ කවරාකාර ක්‍රමයකින් නමුත් ඉන්ද්‍රිය-අර්ථ සන්නිකර්ෂයක් සිදුවීමෙන් ඇති වන දැනුම ප්‍රත්‍යක්ෂ බුද්ධියක් ලෙස සැලකේ.

# අනුමානය

ප්‍රත්‍යක්ෂ ඥානය උපයෝගී කොට ගෙන අප්‍රත්‍යක්ෂ දෙයක් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අනුමාන ඥානය ලෙස හැඳින්විය හැකිය. අනුමාන ඥානය ලබා ගැනීම සඳහා කරණය හෙවත් හේතුව වන්නේ අනුමානයයි. 'අනුව මිණීම' අනුමාන යැයි ද කිව හැකිය. කුමක් අනුව මණින්නේද යත්, තමා පෙර ලද ප්‍රත්‍යක්ෂ ඥානය අනුවය. මෙය සම්‍යග්ඥානය ලබා ගැනීමේ එක් ක්‍රමයක් ලෙස නෛයායිකයෝ සලකති. 'අනුමන සඳහා අත්‍යවශ්‍යම කරුණ වන්නේ ව්‍යාප්තියයි.' එය ප්‍රත්‍යක්ෂයට ඉන්ද්‍රිය-අරමුණු අතර සන්නිකර්ෂය මෙනි. මෙහි ව්‍යාප්තිය යන්නෙන් අදහස් වන්නේ 'හේතුව සහ ඔප්පු කළයුතු දෙය අතර පවතින සම්බන්ධය නොකැඩී, නොබිඳී ඒකාබද්ධව අවියෝජනීයව පැවැතීමයි.'[12] 'යම් තැනක දුම ඇද්ද එහි ගිනි ඇත.''යම් තැනක හිම ඇද්ද එහි සීතල ඇත.' 'යමෙකුට තටු ඇද්ද ඔහු පියාඹන්නෙකි.' දුම සහ ගිනි, හිම සහ සීතල, තටු සහ පියාඹීම, යන මේවා අතර අවියෝජනීය සම්බන්ධතාව අප අත්දැකීමෙන් දැක ඇත. මෙසේ හේතුව සහ ඔප්පු කළයුතු දෙය අතර නොකැඩුණු බැඳීම ව්‍යාප්තිය නම් වේ.

අනුමාන ඥානයක් උපදවා ගැනීම පිණිස කරුණු හතරක් තිබිය යුතුය. එනම්;

i. ලිංගය නැතහෝ හේතුව (=සාධනය)

ii. පක්ෂය නැතහොත් ලිංගයට ආධාරය.

ii. සාධ්‍යය හෙවත් ඔප්පු කළයුතු දේ.

iv. ව්‍යාප්තිය.

මෙම කරුණු හතර හඳුනා ගැනීමට ගින්න නිදසුන් කොට ගත් කල්හී ගිනි ඇති බව ඔප්පු කිරීමට දක්වන හේතුව වන දුම් ලිංගයයි. පර්වතයෙහි ගිනි ඇත යන මෙහි දුම පැවතීමට ආධාරය වන පර්වතය පක්ෂයයි. සාධ්‍යය හෙවත් ඔප්පු කළයුතු දේ නම් පර්වතයෙහි ගිනි ඇති බවයි. ව්‍යාප්තිය නම් ගින්න සහ දුම අතර අඛණ්ඩ සම්බන්ධතාවක් පැවතීමයි. මේ අනුව ලිංග, පක්ෂ, සාධ්‍යය, ව්‍යාප්තිය යන

කරුණු හතරේ ඒකීභූත නිශ්චිත දැනුම අනුමානඥානයයි. සෑම අනුමානයක් තුළම මෙම කරුණු හතර දක්නා ලැබේ.

අනුමානය ස්වාර්ථානුමානය හා පරාර්ථානුමානය යනුවෙන් දෙවැදෑරුම් වේ.[13] තම වැටහීම ලබා ගැනීම සඳහා කරනු ලබන අනුමානය ස්වාර්ථානුමානය නම් වේ. තමාම අනමාන ඥානයෙන් ලබා එමගින් වෙනත් අයෙකුට අවබෝධයක් ඇති කරවීම පරාර්ථානුමානයයි. අනුන්ට යමක් වටහාදීම ශබ්ද මගින් කෙරෙන හෙයින් පරාර්ථානුමානය ශබ්දාත්මකය. සංවාක්‍ය මගින් හෙවත් අවයව පහකින් යුතු වාක්‍යයකින් මෙම පරාර්ථානුමානය සිදු කෙරේ. දැනීම පිළිබඳ සැක ඇති අයට මෙම පංච අවයව වාක්‍ය මගින් දැනුම ලබා දීම සිදු කෙරෙන බව කිව යුතුය. එම අවයව පස මෙසේය.

i. ප්‍රතිඥා හෙවත් ප්‍රකාශය.

ii. හේතුව.

iii. උදාහරණය.

iv. උපනය හෙවත් හේතුව ප්‍රතිඥාවත් සමග එකට ගැළපීම.

v. නිගමනය හෙවත් එය එසේ යැයි තීරණය කිරීම.

| | | |
|---|---|---|
| ප්‍රතිඥා | : | කුකුළා පක්ෂියෙකි. |
| හේතුව | : | පියාපත්වලින් ඉගිලෙන හෙයිනි. |
| උදාහරණය | : | කපුටා මෙනි. |
| උපනය | : | මොහුත් එසේය. (කුකුළාටත් පියාපත්වලින් ඉගිලිය හැකිය.) |
| නිගමනය | : | එහෙයින් එසේය. හෙවත් කුකුළා පක්ෂියෙකි. |

මෙහිදී උදාහරණයට දිය යුත්තේ සැකයක් නැතිව පිළිගත හැකි දෙයකි. එසේම ව්‍යාප්තිය හෙවත් ප්‍රතිබන්ධය වැරදි නම් සමස්තමය වැරදි වේ. තවද ස්වාර්ථ අනුමිතියටත්, පරාර්ථ අනුමිතියටත් කරණය වන්නේ ලිංග පරාමර්ශයයි. එනිසා ලිංග පරාමර්ශය අනුමානය වේ. ලිංගය යනු හඳුනා ගැනීමේ ලක්ෂණයයි, හේතුවයි. එම ලිංගය තුන්වැදෑරුම් වේ.

i. අන්වයව්‍යතිරේකී. ii. කෙවලාන්වයී.

iii. කෙවලව්‍යතිරේකී යනුවෙනි.

දුම ඇති තැන ගිනි ඇත, යන්න අන්වයව්‍යතිරේකයයි. ව්‍යාප්‍ය (දුම) දුම ව්‍යාපක (ගිනි) දෙකේ එකට බැඳුණු බව අන්වයව්‍යතිරේකයයි. ව්‍යාප්‍ය හා ව්‍යාපක දෙකේ එකීය පැවැත්මක් නැති බව දැක්වීම ව්‍යතිරේක ව්‍යාප්තියයි. තවත් විධියකින් කිවහොත් අන්වයයෙන් හෝ ව්‍යතිරේකයෙන් යන දෙකෙන්ම යමක් ප්‍රකාශ කළ හැකි නම් එය අන්වයව්‍යතිරේකී නම් වේ. දුම නැති තැන ගිනි නැත යනු නිදසුනකි. කේවලාන්වයී යන්නෙන් අදහස් වන්නේ අන්වයෙන් පමණක් ප්‍රකාශ කළ හැකි දෙයයි. කළය නමක් ඇති දෙයකි. හඳුනා ගත හැකි 'වස්ත්‍රය මෙනි' යන මෙය කේවලාන්වයී යන්නට නිදසුනකි. මෙහි එකක නොපැවැත්ම අනෙකේ නොපැවැත්ම පෙන්වන ව්‍යතිරේක පක්ෂය නැත. එබැවින් කේවලාන්වයී නම් වේ. අන්වය අංශය නොදක්වන ව්‍යතිරේකී අංශය පමණක් දක්වන ප්‍රකාශය කේවලව්‍යතිරේකී නම් වේ. තවත් විධියකින් කිවහොත් ව්‍යතිරේකයෙන් පමණක් ප්‍රකාශ කළ දෙය කේවලව්‍යතිරේකී නම් වේ. 'පොළොව අනික් ඒවායින් වෙනස් වේ. ගන්ධයෙන් යුක්ත හෙයිනි.' යනු නිදසුනකි. මෙහි අන්වය අංශය නොදිස්වේ. එහෙයින් කේවලව්‍යතිරේකී නම් වේ. මේ අනුව අන්වය විධිය නම් එක දෙකක් විද්‍යමාන වන විට තවත් දෙයක් නිරන්තරයෙන්ම විද්‍යමාන වීම් වශයෙන් පවතින අඛණ්ඩ සම්බන්ධතාවයි. ව්‍යතිරේක විධිය නම් එක දෙයක් අවිද්‍යමාන වන විට තවත් දෙයක් නිරන්තරයෙන්ම අවිද්‍යමාන වීම් වශයෙන් පවතින නිසැක සම්බන්ධතාවයි. මේ දෙවිධියෙන් පරීක්ෂා කර බැලීමෙන් යමක් පිළිබඳ නියම හේතුව සොයා ගත හැකිය.

# හේත්වාභාස

අනුමානයේ දි වැදගත්ම සාධකය වන්නේ හේතුවයි. මෙහි හේත්වාභාස පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට ඇත්තේ එකී හේතු පිළිබඳ සාකච්ඡා කළ යුතු නිසාවෙනි. අසම්පූර්ණ වූ හේතුව හේත්වාභාස නම් වේ. 'හේතුවක් මෙන් පෙනෙන එහෙත් නියම හේතුවක් නොවන ව්‍යාජ හේතුව හේත්වාභාසයකි.' තර්කසංග්‍රහයේ එබඳු හේත්වාභාස පහක් දක්වා ඇත.[13]

i. සව්‍යභිචාර ii. විරුද්ධ iii. සප්‍රතිපක්ෂ iv. අසිද්ධ v. බාධිත

සව්‍යභිචාර යන්නට තවත් සමාන වචනයක් නම් අනෛකාන්තික යන්නයි.[14] එයින් අදහස් වන්නේ ඒකාන්ත නොවන යන්නයි. බෞද්ධ න්‍යායෙහි මේ සඳහා භාවිත කරන්නේ සංදිග්ධ (සැකසහිත) හෝ අනිශ්චිත යන වචනයයි. කෙසේ නමුත් හේතුවේ පවත ස්ථිර නැති බව, ඒකාන්ත නොවන බව, සව්‍යභිචාරයයි. 'චන්ද්‍රග්‍රහණය ප්‍රකෘති අසින් නොබැලිය යුතු බවට හේතුව ලෙස දක්වන්නේ ඇස් අන්ධවීමයි. නමුත් එසේ කිරීමෙන් ඇස් අන්ධ වූවෝද විය හැකිය, නොවූවෝද විය හැකිය. මේ නිසා හේතුව ඒකාන්ත නැත. මේ සඳහා තර්ක සංග්‍රහය දක්වන්නේ 'ශබ්දය නිත්‍යය. ශ්පර්ෂ කළ නොහැකි හෙයිනි.' යන්නයි. මෙහිදු ස්පර්ශ කළ නො හැකි වීම නිත්‍ය බවෙහි අනිවාර්ය ලක්ෂණයක් නොවේ.

විරුද්ධ හේත්වාභාසය නමින් අදහස් වන්නේ යමක් ඔප්පු කිරීම සඳහා දක්වන ලද හේතුව හෙවත් තර්කය එය ඛණ්ඩනය වීම සඳහා හේතුවක් වන්නේ නම් එයයි. 'මොහු පිරිමියෙකි. සාරියක් හා හැට්ටයක් අඳින හෙයිනි.' යන මෙහි දක්වන ලද හේතුව පිරිමි බව ඔප්පු කිරීමට විරුද්ධ වන්නකි. එයින් ඔප්පු වන්නේ පිරිමියෙක් නොවන බවයි. එබැවින් මෙම හේතුව විරුද්ධ හේත්වාභාසයකි.

සප්‍රතිපක්ෂ හේත්වාභාසයෙන් කියැවෙන්නේ ප්‍රතිපක්ෂ හේතු සහිත බවයි. යමක් ඔප්පු කිරීමට දක්වන ලද හේතුවට අමතරව ඔප්පු නොවීම සඳහා හේතුවකුත් විද්‍යමාන වේ නම්, එය සප්‍රතිපක්ෂ හේත්වාභාස ලක්ෂණයයි.

i. ශබ්දය නිත්‍ය ශ්‍රාවණත්වයෙන් (ශ්‍රවණ යෝග්‍ය) යුක්ත හෙයිනි. ශබ්දත්වය මෙනි.

ii. ශබ්ද අනිත්‍යය. කාර්‍ය්‍යරූපී හෙයිනි. කළය මෙනි.

ආකාශය නිත්‍ය ද්‍රව්‍යයක් බව න්‍යායිකයන්ගේ පිළිගැනීමයි. එම නිත්‍ය ආකාශය ඇසුරු කළ ශබ්දය ද ශ්‍රවණත්‍ව ගුණය නිසා නිත්‍ය යනු පිළිගැනීමයි. එයින් ශබ්දයේ නිත්‍ය බව තහවුරු වේ. එසේම කළය වැනි කාර්‍ය්‍ය ස්වරූපී සියලුම දේ ඒකාන්තයෙන්ම අනිත්‍යය. ශබ්දය ද කිසිවකු විසින් කරනු ලබන කාර්‍ය්‍යයකි. එබැවින් එය ද අනිත්‍ය විය යුතුය. මෙසේ මුලින් දක්වූ හේතුවෙන් නිත්‍යත්වය තහවුරු වන අතර දෙවැන්නෙන් අනිත්‍යත්වය තහවුරු වේ. එබැවින් මෙය සප්‍රතිපක්‍ෂ නම් වේ.

අසින්ධ හේත්වාභාසයෙන් අදහස් වන්නේ නිවැරදි හේතුවක තිබිය යුතු අංගවලින් හීනවීමයි. පක්ෂය හෙවත් ආශ්‍රය සැබැවින්ම අවිද්‍යමාන වූ කල්පිතමාත්‍රයක් වේ නම් එය අසිද්ධහේත්වාභාසයකි. 'ආකාශපද්මය සුවඳවත්ය. පද්මය සුවඳවත් වන හෙයිනි. ශ්වේතපද්මය මෙනි.' මෙහි ආකාශ පද්මය යන්න කල්පිතයකි. සැබවින්ම එවැන්නක් නැත. එබැවින් සුවඳවත් බව ඔප්පු කිරීමට ආශ්‍රය වූ ආකාශපද්මය යන්න නියම හේතුවක් නොවේ.

බාධිත හේත්වාභාසය යන්නෙන් අදහස් කෙරෙනුයේ යමක් ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද හේතුව ප්‍රත්‍යක්ෂ ආදී වෙනත් ප්‍රමාණයකින් බාධා කරන ලද්දක් වීමයි. 'ගින්න උෂ්ණ ස්පර්ශ ඇත්තේය. ද්‍රව්‍ය හෙයිනි.' ශීතල හා උෂ්ණය ත්වග් ඉන්ද්‍රියෙන් ප්‍රත්‍යක්ෂ කළ යුතු දේවල්ය. එය කාට වුවත් ප්‍රත්‍යක්ෂයෙන් දත හැකිය. මෙහි නිදසුන් හේතුව ලෙස දක්වන්නේ ද්‍රව්‍යත්වයයි. ගින්න උණුසුම් පහස් ඇති බව දැක්වීමට පෙන්වූ එම හේතුව සාධන භාවයෙන් තොර වූවකි. එබැවින් එය හේත්වාභාසයකි.

යථාර්ථවත් අනුමානඥානයක් ලබා ගැනීමට නම් අනුමානයේදී වැදගත් අංගයක් වන හේත්වාභාසයන් මැනවින් හඳුනා ගෙන එයින් මිදී නිවැරදි හේතු මගින් එය කළයුතු වේ. සම්‍යග්ඥානයක්

ලබා ගැනීම සඳහා බෞද්ධ න්‍යාය මගින් පිළිගන්නා ලද්දේ මෙම ප්‍රත්‍යක්ෂ-අනුමාන යන ප්‍රමාණ දෙක පමණකි.

## උපමානය

උපමානය ද ප්‍රත්‍යක්ෂාදිය මෙන්ම නිවැරදි දැනුමක් සපයන මගක් බව දර්ශන ශාස්ත්‍රයෙහි පිළිගැනේ. න්‍යාය, මීමාංසා සහා වේදාන්ත දාර්ශනිකයෝ මේ මතය දැඩිව වැළඳ ගත්තාහු වෙති. සාංඛ්‍ය, යෝග හා වෛශේෂිකයෝ උපමානය දැනුම ලබන ප්‍රමාණයක් ලෙස නොපිළිගන්නාහු වෙති. ජෛන හා බෞද්ධ න්‍යාය ශාස්ත්‍රවල ද මෙය වෙනම ප්‍රමාණයක් ලෙස පිළිගන්නේ නැත. උපමානයෙන් ලැබෙන ඵලය උපමිතියයි. උපමානය නම් එක් දෙයකට තවත් දෙයක් සම කොට දැක්වීමයි. මෙයට නිදසුන් මුලින් දක්වන ලද ත්‍රිපිටක සූත්‍රයන්හිද 'උපමාය පි භික්ඛවෙ ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්‍ථං ජානිස්සන්ති'[15] යනුවෙන් දක්වන ලද හෙයින් උපමාව ද දැනුම ලබා ගැනීමට උපකාරී වන බව පිළිගත් බැව් පෙනේ.

## ශාබ්ද හෙවත් ආප්ත වාක්‍ය

ප්‍රාමාණික හෙවත් විශ්වාස කටයුතු පුද්ගලයෙකුගේ ප්‍රකාශය ආප්ත වාක්‍යය නම් වේ. ආප්ත වාක්‍යයෙන් කියන දේ නිවැරදිව වටහා ගැනීම ශාබ්ද බුද්ධියයි. මේ නිසා ශාබ්ද බුද්ධිය ලැබෙනුයේ වාක්‍යයක් මගිනි. ආප්ත වාක්‍ය තේරුම් ගැනීමට, යථාර්ථවත් වීමට කරුණු තුනක් අවශ්‍ය වේ.

i. ආකංෂාව ii. යොග්‍යතාව iii. සන්නිධිය යනුවෙනි.[16]

වාක්‍යයක ඇති පද අතුරෙන් එකක් හෝ අඩු වුවහොත් එය අර්ථවත් වන්නේ නැති හෙයින් එම අඩු වචනය අපේක්ෂා කිරීම ආකාංක්ෂා යන්නෙන් කියැවේ. යොග්‍යතා යන්නෙන් අදහස් වන්නේ වාක්‍යාර්ථයට බාධා නොකරවන බවය. සන්නිධිය නම් ආසන්න බවයි. වාක්‍යාර්ථ තේරුම් ගැනීමට නොහැකි වන සේ පදයක් අතර කාලයෙන් හෝ වෙනත් දෙයකින් අතරක් නැති නො කොට තැබීම මෙයින් අපේක්ෂිතයි.

මෙසේ තර්කසංග්‍රහය දක්වන ප්‍රමා හෙවත් යථාර්ථඥාන හතරක් වේ. මෙය වටහා ගැනීමේ දී ආධුනිකයෙකු විසින් බෞද්ධ ඉගැන්වීම්වල ආධාරයෙන් පූර්ව විනිශ්චයන්ට බැස සිටීම නොකළ යුතුය. හුදෙක් තර්කසංග්‍රහයේ ඉගැන්වෙනුයේ හින්දු ශාස්ත්‍රයට අදාළ දේ පමණක් වන හෙයිනි. එසේ වුවත් බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය ගැන පුළුල් අවබෝධයක් ලබා ගැනීම සඳහා තර්කසංග්‍රහය මහත් පිටුවහලක් වේ.

**පාදක සටහන්.**

1. **තර්කසංග්‍රහ විවරණය**, පණ්ඩිත වරකාගොඩ සීලරතන ස්ථවිර, ප්‍රස්තාවනාව, 1987 මුද්‍රණය.

2. 'ද්‍රව්‍යගුණකර්මසාමාන්‍යවිශේෂසමවායාභාවාඃ සප්තපදාර්ථාඃ' **තර්කසංග්‍රහය.**

3. 'යථාර්ථානුභවශ්චතුර්විධඃ, ප්‍රත්‍යක්ෂානුමිත්‍යුපමිතිශාබ්දාභෙදාත්' **තර්කසංග්‍රහය.**

4. 'ද්විධං සම්‍යග්ඥානං ප්‍රත්‍යක්ෂානුමානඤ්ච' **න්‍යාය බිංදුව**, පි.1

5. 'ඉන්ද්‍රියාර්ථසන්නිකර්ෂජන්‍යං ඥානං ප්‍රත්‍යක්ෂම්' ප්‍රත්‍යක්ෂ ප්‍රමාණය බලන්න.

6. **'තර්කසංග්‍රහය'**, **බුද්ධි ප්‍රකරණය** බලන්න.

7. 'තද්වති තත් ප්‍රකාරකො නුභවො යතාර්ථඃ' තර්කසංග්‍රහය.

8. 'අසාධාරණං කාරණං කරණම්'

9. ‘ඉන්ද්‍රියාර්ථසන්නිකර්ෂජන්‍යං ඥානං ප්‍රත්‍යක්ෂම්’

10. ‘නිෂ්ප්‍රකාරං ඥානං නිර්විගල්පකම්’ ප්‍රත්‍යක්ෂ ප්‍රමාණය බලන්න.

11. ‘සප්‍රකාරකං ඥානං සවිකල්පකම්’ ප්‍රත්‍යක්ෂ ප්‍රමාණය බලන්න.

12. **‘තර්කසංග්‍රහ විවරණය’**, පණ්ඩිත වරකාගොඩ සීලරතන ස්ථවිර, 1 මුද්‍රණය. පි. 140

13. ‘අනුමානං ද්විධං, ස්වාර්ථං පරාර්ථඤ්චෙති’ අනුමාන ප්‍රමාණය.

14. ‘සව්‍යභිචාරො නෛකාන්තිකඃ’ හේත්වාභාස විස්තරය බලන්න.

15. **මජ්ඣිමනිකායේ** අලගද්දූපම සූත්‍රය බලන්න.

16. ‘ආකාංක්ෂා යොග්‍යතාසන්නිධිශ්ච වාක්‍යාර්ථඥානෙ හෙතුඃ’ ශබ්දප්‍රමාණය බලන්න.